දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எனது இல. / My No.: PSC/APL/3/AT/VET/2025
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2026.01. 21

**ලේකම්**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

**<u>2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**
**<u>ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය - පශු වෛද්‍ය නිලධාරී</u>**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු වෛද්‍ය නිලධාරීන්ගේ 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණ www.psc.gov.lk දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කර ඇත.

02. ඒ අනුව **වහාම** එකී ස්ථාන මාරු ක්‍රියාත්මක කරන ලෙසත්, නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි. එසේම මීළඟ වර්ෂයේ සිට වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී ස්ථාන මාරු පටිපාටියෙහි දක්වා ඇති කාල සටහනට අනුගතව සියලු කටයුතු කිරීමට තරයේ සැලකිලිමත් වන ලෙස ඔබ වෙත දැන්වීමටද රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන ලද බව කාරුණිකව දන්වමි.

03. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම ඇත්තේය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බවද කාරුණිකව දැනුම් දෙමි.

05. 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධාරීන් වහාම නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම ආයතන ප්‍රධානීන්ගේ

වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙසද ඔබ වෙත දන්වා සිටිමි.

06. වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 (V) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැරයාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

07. එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිම.

Mday

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත:
01.අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව- කරු. දැ.ගැ.ස. සහ අ.ක.ස.

## වාර්ෂික ස්ථාන මාරු අභියාචනා තීරණ - 2025
## ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය - පශු වෛද්‍ය නිලධාරී

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර හා ශ්‍රේණිය | වර්තමාන සේවා ස්ථානය | නව සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 1 | මුල්ලකන්දගේ කෞශල්‍යා සඳමාලි මිය | පශු වෛද්‍ය නිලධාරී - III ශ්‍රේණිය | සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථානය - මත්තල | - | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 2 | නවගමුවගේ සුවිමාලි සඳුනිකා පෙරේරා මිය | පශු වෛද්‍ය නිලධාරී - III ශ්‍රේණිය | රජයේ පශු වෛද්‍ය කාර්යාලය - තඹලගමුව | මධ්‍යම පළාත | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 3 | රත්නායක මුදියන්සේලාගේ ඉරේෂා මධුෂානි රත්නායන මෙය | පශු වෛද්‍ය නිලධාරී - III ශ්‍රේණිය | පළාත් අධ්‍යක්ෂ කාර්යාලය - නැගෙනහිර පළාත | මධ්‍යම පළාත | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |

2026/01/16

2026/01/16